# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය
# ස්වයං අධ්‍යාපන ඉගෙනුම් අත්වැල
# 10 ශ්‍රේණිය- නර්තනය

**ඒකකය:- චාමර සහ රබන් නර්තනය**

**චාමර හැඳින්වීම**

චාමරය සෙමෙර සැලීම හෙවත් පවන් සැලීම සඳහා යොදාගෙන ඇති බව එහි පසුබිම පිළිබඳ සොයා බැලීමේදී පැහැදිලි වේ. අතීතයේ දී චාමරය නිර්මාණය කර ඇත්තේ "සෙමෙරා" නමින් හඳුන්වන බිලාල කුලයට අයත් අලංකාර සත්වයෙකුගේ ව්‍යාධියෙනි. එබැවින් චාමර සැලීම සෙමෙර සැලීම යනුවෙන් හඳුන්වනු ලබයි.

චාමර භාවිතා වූ අවස්ථා

- අතීතයේ බුදුන්ට, දෙවියන්ට, රජවරුන්ට සෙමෙර සැලූ බව ඉතිහාසයේ සඳහන් වේ.
- විහාර කර්මාන්ත චිත්‍රයන්හි බුදුන් වහන්සේ දෙපස චාමර අතින් ගත් දෙවිවරුන්ගේ රූප බොහෝවිට දැකගත හැකිය.
- මහනුවර දළදා පෙරහැරේ දන්ත ධාතූන් වහන්සේගේ කරඬුව දෙපස දැලේ යන ඇතුන් පිටනැග චාමර සලමින් යන චාමර ධරයන් වර්තමානයේද දැකගත හැකි අතර චාමර ගෙන නටන අවස්ථාද වේ.

චාමර සැලීම ගෞරව දැක්වීම සඳහා කරන ලද්දකි. අඩියක් පමණ දිග රවුම් ලීයක අගට හන හා නියඳ වලින් සුසිනිඳු කෙඳි වර්ගයක් යොදා ගනිමින් චාමරය සකස් කරගනී. චාමර කවි සෘජුවම ජන ජීවිතය හා සම්බන්ධව නොපවතින අතර මේ සඳහා අතීතයේ සිට භාවිතා වී ඇත්තේ බුද්ධ, දේව, රාජ ප්‍රශස්තිය. වර්තමානයේ විවිධ නාදමාලා, විවිධ තාලරූප වලට කවි ගායනා නිර්මාණය වී ඇත.

චාමර නර්තනය කාන්තාවන් සඳහා සුවිශේෂී නර්තනයක් වන අතර පිරිමි අයද චාමර නර්තනය කරනු ලබයි. සාම්ප්‍රදායිකව එක් චාමරයක් අතැතිව නර්තනය කරන අතර වර්තමානයේ දැතට චාමර දෙකක් ගෙන නර්තනය කරයි.

ලාස්‍ය ලක්ෂණයෙන් යුතුව දුහුල් කෙඳි ඒ මේ අතට විසිරී යන පරිදි චාමරය සැලීමෙන් අවකාශයෙහි ඉතා සුන්දර දසුන් මැවෙන පරිදි චාමර නර්තනය නිර්මාණය කෙරේ.



## චාමර කවි




සොබමන් දෙවිවරු සදෙනෙක් එතැනට
බසිමින් චාමර ගන්නේ සුරතට
ගනිමින් චාමර සැලුවේ මුනිඳු
අපි දැන් දක්වමු ඒ රඟ සබයට

සුර අඟනක් දෝ මෙපුර ලඳක් දෝ
දෑලේ සිට චාමර සලනා
වලා පෙලක් දෝ එමැද සඳක් දෝ
දෑලේ රඟ දෙන ලිය සොබනා

- චාමර නර්තන වල රාජසභා ගති ලක්ෂණ ඇති බැවින් ප්‍රශස්ති කවිද නර්තනයේ දී යොදා ගනී.

ජය ජය සිංහ නරේන්ද්‍රා - රක්ෂි රක්ෂි ජය ජය සිංහ සුරේන්ද්‍රා

ජය ජය සිංහ සුරේන්ද්‍රා - රක්ෂි රක්ෂි ජය ජය කන්ද සුරේන්ද්‍රා

# රබන් නැටුම

එකැස් බෙරය නමින් හඳුන්වන රබන් වර්ග කිහිපයකි.



- බංකු රබාන හෙවත් මහ රබාන
- විරිඳු රබාන
- අත් රබාන
- තැටි රබාන ( කරකවන රබාන් )

ආතත සනයට අයත් අවනද්‍ය භාණ්ඩයක් වන රබන් විවිධ අවස්ථා සඳහා යොදාගෙන ඇත.

· ආගමික අවස්ථා ¬

· සූවිසි විවරණ

· පෙරහැර අවස්ථා

තවද සන්නිවේදන අවස්ථා

උදා- මංගල උත්සව අවස්ථා
අවුරුදු සමයේදී ද රබන් වාදනය කෙරේ.

· තැටි රබාන රබන් කරකැවීම සඳහා යොදාගන්නා අතර වට්ටු (රබන් රඳවන උපකරණය) කීපයක් සමබර කර ගනිමින් නර්තනය කිරීම ශිල්පියාගේ දක්ශකමකි.

· රබන් නර්තනය සඳහා අත් රබාන යොදාගන්නා අතර එක් අතකින් රබාන ගෙන එය වයමින් විවිධ රටා මැවෙන සේ අවකාශය තුළ හසුරුවමින් නර්තනය කරයි.

· ගැහැණු පිරිමි දෙපක්ෂයම රබන් නර්තනය කරන අතර තැටි රබන් කරකැවීමද මුසු කරගනිමින් අලංකාර රබන් නර්තන නිර්මාණය කරගනී.

· විලම්බ, මධ්‍ය ලය මුල් කර ගනිමින් ලාස්‍ය චලන රබන් නැටුම සඳහා යොදාගනී. බෝධිසත්ව චරිතය, කාන්තා ලාලිත්‍යය, ස්වභාව සෞන්දර්ය වර්ණනා ඇතුළත් කවි ගායනා රබන් නර්තනය සඳහා යොදාගනී.



# කාර්ය පත්‍රිකාව

යා කරන්න

| | |
|---|---|
| 1.අවනද්‍ය භාණ්ඩ | සෙමෙර සැලීම |
| 2.රබන් යොදාගත් ආගමික අවස්ථා | එකැස් බෙරය |
| 3.තැටි රබාන | සූවිසි විවරණ |
| 4.ප්‍රශස්ති ගායනා | චාමර නර්තනය |
| 5.චාමරය | රබන් කරකැවීම |

පිළිතුරු සපයන්න.

1.රබන් හා චාමර නර්තන දැකිය හැකි අවස්ථා තුනක් ලියන්න.

2.රබන් කවියක් සහ චාමර කවියක් ගායනය කරන්න.

3. චාමර සහ රබන් නර්තනයන් පිළිබඳව පන්ති කාමරයේදී ඉදිරිපත් කිරීම සඳහා කතාවක් සකස් කරන්න.